ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2018 ජූලි මස 20 වැනි දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 මැයි

### සමස්ත නිරීක්ෂණ

2018 වසරේ මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. 2018 වසරේ මැයි මාසයේදී වෙළඳ හිඟය තවදුරටත් පුළුල් වූ නමුත්, ආනයන වර්ධනයට වඩා අපනයන වර්ධනය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල් වීමේ වේගය සාපේක්ෂව අඩු විය. මාසය තුළදී සංචාරක ඉපැයීම් තවදුරටත් වර්ධනය වූ අතර, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහත වැටුණි. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ විදේශීය ගෙවීම් සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ලැබීම් අඩුවීම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. 2018 වසරේ මැයි මාසය අවසානයේදී රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 8.8 ක් විය. මේ අතර, දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් විදේශ විනිමය වෙළඳපොළවල සිදු වූ වර්ධනයන් පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2018 වසරේ මැයි මාසය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුළදී සියයට 3.3 කින් ද, 2018 ජූලි 20 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී සියයට 4.5 කින් ද අවප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2018 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 841 | 924 | 9.8 | 4,410 | 4,707 | 6.7 |
| ආනයන | 1,725 | 1,857 | 7.7 | 8,608 | 9,622 | 11.8 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -884 | -933 | | -4,198 | -4,914 | |
| සංචාරක ඉපැයීම් | 226 (ආ) | 240 (ඇ) | 6.2 | 1,645 (ආ) | 1,888 (ඇ) | 14.7 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 601 (ඈ) | 580 | -3.4 | 3,000 (ඈ) | 3,100 | 3.3 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඉ) | 35 | 5 | | 191 | 53 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 2,263 | 113 | | 3,066 | 3,589 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 187 | 25 | | 572 | 505 | |
| දිගුකාලීන ණය | 126 | 88 | | 544 | 584 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | 450 | - | | 450 | - | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 1,500 | - | | 1,500 | 2,500 | |
| විදේශ සෘජු ආයෝජන (ඊ) | | | | 193 | 492 | |
| සමස්ත ශේෂය | | | | 1,587 | 1,170 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය

(ඈ) සංශෝධිත


(ඉ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ

(ඊ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ ශේෂය

2018 වසරේ මැයි මාසයේදී වෙළඳ ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් වුවද, ආනයන වර්ධනය වීමේ වේගයට සාපේක්ෂව වැඩි වේගයකින් අපනයන වර්ධනය වීම හේතුවෙන් වෙළඳ හිඟය පුළුල්වීම යම් ප්‍රමාණයකට මන්දගාමී විය. 2018 වසරේ පළමු මාස පහ තුළදී සමස්ත වෙළඳ හිඟය ද පුළුල් විය.

### රූප සටහන 1: මාසික වෙළඳ ශේෂය





මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරීත්වය

කෘෂිකාර්මික අපනයන පහත වැටුණ ද ප්‍රධාන වශයෙන්ම කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ මැයි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 924 ක් දක්වා ඉහළ ගියේය. කාර්මික අපනයන සැලකූ විට, රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත වූ අපනයන ද සුළු වශයෙන් වර්ධනය විය. 2018 වසරේ මැයි මාසයේදී නැව් හා ගුවන්යානා සඳහා භාවිත කරන ඉන්ධනවල අපනයන මිල ගණන් සහ අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මෙම මාසය තුළදී සකස් කළ දුම්කොළ සහ පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ඉහළ යෑම හේතුවෙන් ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. තවද, 2018 වසරේ මැයි මාසයේ දැව හා කඩදාසි නිෂ්පාදිත සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් හැර කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලුම කාණ්ඩවලින් වූ ආදායම ඉහළ යෑම කාර්මික අපනයන ඉහළ යෑම සඳහා දායක විය. කෙසේ වුවද, කුළුබඩු සහ මුහුදු ආහාර හැර අනෙකුත් සියලුම කාණ්ඩවල දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් 2018 මැයි මාසයේදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. යුරෝපා සංගමය වෙත මුහුදු ආහාර අපනයන කිරීම සඳහා පනවා තබූ තහනම ඉවත් කිරීමේ සහ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබාගැනීමේ යහපත් ප්‍රවණතා පිළිබිඹු කරමින් මෙම මාසය තුළදී ද මුහුදු ආහාර අපනයන මිල ගණන් සහ අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් මුහුදු ආහාර අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මීට අමතරව, කුරුඳු සහ ගම්මිරිස් අපනයන මිල ගණන් හා අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ මැයි මාසයේදී කුළුබඩු අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, තේ අපනයන පරිමාව හා අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම පහත වැටුණි. 2018 වසරේ මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර, එම රටවල් වෙත සිදු කරන ලද අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 49 ක් පමණ විය.

**රූප සටහන 2: මාසික අපනයන ක්‍රියාකාරීත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)


| කාණ්ඩය | 2017 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2018 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.- මැයි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.- මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **614.5** | **709.7** | **15.5** | **3,316.0** | **3,632.9** | **9.6** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 30.5 | 38.5 | 26.2 | 131.9 | 193.6 | 46.7 |
| සත්ත්ව ආහාර | 4.7 | 7.5 | 57.6 | 33.4 | 45.7 | 36.8 |
| රෙදිපිළි හා ඇඟලුම් | 359.2 | 398.3 | 10.9 | 1,985.5 | 2,065.5 | 4.0 |
| එයින් ඇඟලුම් | 337.7 | 367.8 | 8.9 | 1,869.3 | 1,931.4 | 3.3 |
| රෙදිපිළි | 14.8 | 21.9 | 47.6 | 83.8 | 94.9 | 13.2 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 6.7 | 8.5 | 26.9 | 32.3 | 39.2 | 21.3 |
| රබර් නිෂ්පාදිත | 67.0 | 68.6 | 2.4 | 315.5 | 349.1 | 10.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 22.3 | 23.1 | 3.3 | 103.3 | 129.7 | 25.6 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 25.4 | 36.2 | 42.3 | 151.9 | 174.9 | 15.2 |
| ප්‍රවාහන උපකරණ | 4.3 | 7.9 | 81.2 | 70.7 | 42.4 | (39.9) |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 27.6 | 46.1 | 66.8 | 147.7 | 219.3 | 48.4 |
| රසායනික නිෂ්පාදිත | 11.2 | 14.3 | 28.1 | 58.3 | 66.6 | 14.3 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.1 | 10.6 | (4.6) | 56.4 | 58.0 | 2.8 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.0 | 1.1 | 10.4 | 13.8 | 6.4 | (53.8) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 13.0 | 12.6 | (3.3) | 62.3 | 65.0 | 4.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.6 | 5.7 | 1.7 | 29.1 | 31.8 | 9.3 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 9.3 | 14.5 | 56.1 | 44.6 | 61.9 | 38.9 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.3 | 2.5 | 6.7 | 12.8 | 11.8 | (7.8) |
| වෙනත් | 19.7 | 22.2 | 12.8 | 98.9 | 111.2 | 12.4 |
| **2.කෘෂිකාර්මික අපනයන** | **222.7** | **209.6** | **(5.9)** | **1,074.4** | **1,052.9** | **(2.0)** |
| තේ | 131.6 | 121.2 | (7.9) | 589.8 | 599.3 | 1.6 |
| රබර් | 2.9 | 2.3 | (18.8) | 21.9 | 16.5 | (24.7) |
| පොල් | 27.9 | 24.2 | (13.6) | 143.7 | 125.1 | (12.9) |
| කුළුබඩු | 23.7 | 26.0 | 9.6 | 132.9 | 122.0 | (8.2) |
| එළවළු | 2.8 | 2.1 | (25.4) | 12.4 | 10.8 | (13.0) |
| සකස් නොකළ දුම්කොළ | 3.1 | 2.0 | (33.6) | 13.5 | 13.3 | (1.5) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 13.0 | 10.5 | (19.0) | 58.3 | 51.5 | (11.7) |
| මුහුදු ආහාර | 17.7 | 21.2 | 19.9 | 101.9 | 114.5 | 12.3 |
| **3.ඛනිජ හා වෙනත් අපනයන** | **4.1** | **4.5** | **11.5** | **19.9** | **21.6** | **8.6** |
| **මුළු අපනයන** | **841.2** | **923.8** | **9.8** | **4,410.2** | **4,707.5** | **6.7** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

රූප සටහන 3: මාසික ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන්ම ඉන්ධන සහ රථවාහන ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ මැයි මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,857 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර ඉන්ධනමය නොවන ආනයන වියදම සුළු වශයෙන් පහත වැටුණු අතර, සමස්ත ආනයන වියදම ඉහළ යෑම සඳහා ඉන්ධන ආනයන වියදම ඉහළ දායකත්වයක් දැක්වූ බව මින් පිළිබිඹු විය. මෙම මාසයේදී අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති ඉන්ධන ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිතවල ආනයන මිල ගණන් හා ආනයන පරිමාව ඉහළ යෑම මේ සඳහා හේතු විය. මීට අමතරව, රෙදිපිළි හා උපාංග යටතේ වර්ග කර ඇති සියලුම කාණ්ඩවල ආනයන වියදම, විශේෂයෙන්ම රෙදිපිළි සඳහා වූ වියදම, ඉහළ යෑම පිළිබිඹු කරමින් 2018 වසරේ මැයි මාසයේදී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය. එසේම, මෙම මාසය තුළ අන්තර් භාණ්ඩ ආනයන ඉහළ යෑම සඳහා රසායනික නිෂ්පාදිත, මූල ලෝහ සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත උපාංග ආනයන වියදම ඉහළ යෑම දායක විය. මේ අතර, සිලින්ඩර ධාරිතාව අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් මෝටර් රථ කැපී පෙනෙන ලෙස ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ මැයි මාසයේදී පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම ඉහළ ගියේය. ආයෝජන භාණ්ඩ සැලකූ විට, 2018 වසරේ මැයි මාසයේදී සිමෙන්ති සහ ඇලුමිනියම් නිෂ්පාදිත ආනයනය ඉහළ යෑම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, 2016 වසරේ මුල් කාලයේ සිට කැපී පෙනෙන ලෙස වර්ධනය වූ රත්‍රන් ආනයන වියදම 2018 වසරේ මැයි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 0.1 ක් දක්වා පහත වැටුණි. තවද, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ ආනයන වියදම ද පහත වැටුණි. පාරිභෝගික භාණ්ඩ සැලකූ විට, සහල් , සීනි, කිරි නිෂ්පාදිත, මුහුදු ආහාර, රෙදිපිළි හා උපාංග සහ විදුලි සංදේශ මෙවලම් ආනයනය පහළ යෑම මාසය තුළදී සමස්ත ආනයන වියදම මත වූ පීඩනය අඩු කිරීමට විශාල වශයෙන් දායක විය. 2018 වසරේ මැයි මාසයේදී ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයනය කළ ප්‍රධාන රටවල් ලෙස චීනය, ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය සහ සිංගප්පූරුව පැවති අතර, එම රටවලින් සිදු කළ ආනයන සමස්ත ආනයන වියදමෙන් සියයට 60 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 මැයි (එ.ජ.ඩො. මිලියන) | 2018 මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-මැයි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-මැයි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **383.5** | **414.8** | **8.1** | **1,899.1** | **2,194.8** | **15.6** |
| ආහාර හා පාන වර්ග | 162.9 | 128.6 | (21.1) | 792.1 | 781.2 | (1.4) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 16.0 | 2.3 | (85.7) | 130.5 | 107.8 | (17.4) |
| එයින් සහල් | 14.5 | 0.8 | (94.2) | 125.2 | 99.6 | (20.4) |
| සීනි හා රසකැවිලි | 38.2 | 25.2 | (34.0) | 124.7 | 130.3 | 4.4 |
| කිරි නිෂ්පාදිත | 26.5 | 22.6 | (14.8) | 136.9 | 137.9 | 0.7 |
| එළවළු | 25.4 | 22.6 | (11.0) | 149.7 | 141.7 | (5.3) |
| මුහුදු ආහාර | 21.7 | 17.2 | (20.7) | 90.4 | 94.0 | 4.0 |
| පලතුරු | 8.4 | 8.8 | 4.9 | 37.8 | 41.1 | 8.7 |
| පාන වර්ග | 7.1 | 9.2 | 29.1 | 32.9 | 33.3 | 1.3 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 19.7 | 20.8 | 5.2 | 89.1 | 95.2 | 6.8 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 220.6 | 286.2 | 29.7 | 1,107.1 | 1,413.6 | 27.7 |
| රථවාහන | 68.0 | 149.3 | 119.6 | 316.2 | 665.9 | 110.6 |
| බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත | 42.0 | 41.8 | (0.4) | 203.8 | 210.5 | 3.3 |
| විදුලි සංදේශ උපකරණ | 24.8 | 19.6 | (21.1) | 117.1 | 116.6 | (0.4) |
| රෙදිපිළි හා උපාංග | 30.9 | 24.3 | (21.4) | 174.4 | 140.5 | (19.5) |
| ගෘහ උපකරණ | 17.4 | 14.4 | (17.6) | 109.9 | 101.7 | (7.5) |
| ගෘහ හා දැව භාණ්ඩ | 15.2 | 13.5 | (11.3) | 69.3 | 70.7 | 2.1 |
| රබර් නිෂ්පාදිත | 7.3 | 7.6 | 3.9 | 38.1 | 37.4 | (2.0) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 15.0 | 15.7 | 5.0 | 78.4 | 70.3 | (10.4) |
| **2. අන්තර් භාණ්ඩ** | **864.7** | **1,042.7** | **20.6** | **4,556.9** | **5,372.5** | **17.9** |
| ඉන්ධන | 215.7 | 348.9 | 61.8 | 1,423.9 | 1,750.9 | 23.0 |
| එයින් බොරතෙල් | 36.2 | 115.7 | 220.0 | 243.8 | 319.5 | 31.0 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 179.4 | 233.1 | 29.9 | 1,009.3 | 1,287.1 | 27.5 |
| ගල්අඟුරු | 0.1 | 0.1 | 76.9 | 170.8 | 144.3 | (15.5) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 46.5 | 12.7 | (72.7) | 271.2 | 486.7 | 79.5 |
| එයින් රත්‍රන් | 35.8 | 0.1 | (99.7) | 229.0 | 437.4 | 91.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 227.3 | 246.8 | 8.6 | 1,087.9 | 1,129.5 | 3.8 |
| රසායනික නිෂ්පාදිත | 66.9 | 82.6 | 23.5 | 341.1 | 374.0 | 9.6 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 51.6 | 62.2 | 20.6 | 253.4 | 300.2 | 18.4 |
| මූල ලෝහ | 26.8 | 56.8 | 111.8 | 219.5 | 245.8 | 12.0 |
| තිරිඟු හා ඉරිඟු | 37.4 | 44.7 | 19.3 | 155.2 | 174.9 | 12.7 |
| රබර් හා ඒ ආශ්‍රිත උපාංග | 30.2 | 20.8 | (30.9) | 121.7 | 103.7 | (14.9) |
| පොහොර | 4.5 | 12.1 | 168.9 | 27.1 | 100.6 | 270.8 |
| සකස් නොකළ දුම්කොළ | 4.7 | 7.1 | 49.6 | 19.8 | 28.8 | 45.2 |
| වෙනත් | 153.1 | 148.0 | (3.3) | 636.0 | 677.6 | 6.5 |
| **3. ආයෝජන භාණ්ඩ** | **427.3** | **398.2** | **(6.8)** | **2,041.9** | **1,988.9** | **(2.6)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 226.9 | 201.4 | (11.2) | 1,098.8 | 1,068.3 | (2.8) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 137.0 | 142.3 | 3.8 | 661.1 | 642.0 | (2.9) |
| ප්‍රවාහන උපකරණ | 62.9 | 54.2 | (13.9) | 278.1 | 275.6 | (0.9) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.4 | 0.3 | (29.9) | 3.9 | 3.0 | (21.8) |
| **4. වර්ග නොකළ ආනයන** | 49.2 | 1.2 | (97.5) | 110.1 | 65.3 | (40.7) |
| **මුළු ආනයන** | **1,724.7** | **1,857.0** | **7.7** | **8,608.1** | **9,621.6** | **11.8** |


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්


2018 වසරේ මැයි මාසයේදී සංචාරක පැමිණීම්, 2017 වසරේ මැයි මාසයේදී වාර්තා වූ 121,891 ට සාපේක්ෂව 129,466 ක් දක්වා සියයට 6.2 කින් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් ජනපදය, ජර්මනිය සහ ඕස්ට්‍රේලියාව යන රටවල් 2018 වසරේ මැයි මාසයේ සංචාරකයින් පැමිණි ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 2018 වසරේ මැයි මාසය තුළදී පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 62.0 ක් විය. 2018 වසරේ පළමු මාස පහ තුළදී පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 1,017,819 ක් දක්වා සියයට 14.7 කින් වර්ධනය විය. 2018 වසරේ මැයි මාසයේදී සංචාරක ඉපැයීම්, සංචාරක පැමිණීම් මෙන්ම වර්ධනය වූ අතර, එය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 240 ක් දක්වා වර්ධනය විය. මේ අතර, පසුගිය මාස දෙක තුළදී දක්නට ලැබුණු හිතකර වර්ධනයෙහි වෙනසක් ඇති කරමින්, 2018 වසරේ මැයි මාසයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2017 වසරේ මැයි මාසයේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 601 හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 580 ක් දක්වා සියයට 3.4 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස පහ තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්හි සමුච්චිත අගය, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,100 දක්වා සියයට 3.3 කින් වර්ධනය විය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
බලපත්‍රලාභී වාණිජ බැංකු
ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්


2018 වසරේ මැයි මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 89 ක ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, 2018 වසරේ පළමු මාස පහ තුළදී සමුච්චිත ශුද්ධ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 102 ක් විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත

බැංකුව මගින් පොලී අනුපාත ඉහළ දැමීම හේතුවෙන් විදේශ ආයෝජකයින් විසින් තම ආයෝජන කළඹ වෙනස් කිරීම, ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙතින් වාර්තා වූ ගෙවීම් තුළින් පුළුල් ලෙස පිළිබිඹු කරයි. ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ විදේශ විනිමය ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන, 2018 වසරේ මැයි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 5 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, 2018 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුළදී එ.ජ. ඩොලර් මිලියන 53 ක සමුච්චිත ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. රජය වෙත වූ දිගුකාලීන ණය, 2018 වසරේ මැයි මාසය සඳහා සහ වසරේ පළමු මාස පහ සඳහා පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 325 ක සහ එ.ජ. ඩොලර් මිලියන 231 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය, 2018 වසරේ අප්‍රේල් මාසය අවසානයේදී වාර්තා වූ මෙතෙක් පැවති ඉහළම මට්ටම වන එ.ජ. ඩොලර් බිලියන 9.9 සිට 2018 වසරේ මැයි මාසය අවසාන වන විට ආනයනික මාස 4.8 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.8 ක් දක්වා පහළ ගිය අතර, මාසය තුළදී ආසියානු නිෂ්කාශන සංගමය වෙත වූ ගෙවීම්, ඒකාබද්ධ ණය පහසුකමෙහි වාරික ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආපසු ගෙවීම් මේ සඳහා මූලිකවම හේතු විය. මේ අතර, 2018 වසරේ මැයි මාසය අවසාන වන විට, බැංකු අංශයේ විදේශ වත්කම් ද ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 11.0 ක් (ආනයනික මාස 6.0 කට සමාන වන පරිදි) විය.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

2018 වසරේ ජූලි 20 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 4.5 කින් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, කැනේඩියානු ඩොලරය, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියල හැර වෙනත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අවප්‍රමාණය විය.

**රූප සටහන 7 :**
**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**
**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 | 2018 ජූලි 20 දක්වා අතිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.0% | -4.5% |
| යුරෝ | -13.5% | -2.0% |
| ස්ටර්ලින් පවුම | -10.5% | -1.3% |
| ජපන් යෙන් | -5.1% | -4.7% |
| කැනේඩියානු ඩොලරය | -8.6% | +0.8% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -9.0% | +1.3% |
| ඉන්දියානු රුපියල | -7.5% | +2.9% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව